# අස්ගිරි මහාවිහාරයීය පරමධර්ම කතිකාවත
## (ක්‍රි. ව. 1858 - පුස්කොළ පිටපතක් ඇසුරෙණි)

- වයි. කේ. තිස්ස බණ්ඩාර

### ප්‍රවේශය

"**කතිකා**" සම්බන්ධයෙන් තොරතුරු බුදුන්වහන්සේ දවස සිට පැවෙතෙන අයුරු පෙළට අනුව පැහැදිලිවෙයි. එකී නිදසුන් කීපයක් මෙහි අන්තර්ගත කෙරෙනුයේ කතිකාවත්වල ශාසනික සම්බන්ධය පැහැදිලි කිරීම සඳහා ය. බුදුන් වහන්සේ භික්ෂුන්ට කතිකා අනුදැන වදාළහ. ඒ මෙසේ ය. "***අනුජානාමි භික්ඛවෙ කතිකං කත්වා ඔක්කමන්තානං අකාමා භාගං දාතුන්ති***"[1] (මහණෙනි කතිකා කොට පැමිණෙන්නවුන්ට නො කැමැත්තෙන් කොටස දෙන්නට අනුදනමි).

එසේ වදරන්නට හේතුව මෙසේ ය. එකල්හී බොහෝ භික්ෂූහු කොසොල් දනව්වෙහි දීර්ඝ මාර්ගයට පිළිපන්නාහු වෙත් ඒ භික්ෂූහු කතිකා කොට පංසකුල පිණිස සොහොනට පිවිසියාහූය (***තෙන ඛො පන සමයෙන සම්බහුලා භික්ඛු කොසලෙසු ජනපදෙසු අද්ධානමග්ග පටිපන්නා හොන්ති තෙ කතිකං කත්වා සුසානං ඔක්කමිංසු පංසකූලාය)***[2].

කතිකාවෙන් භික්ෂුන්ට සිවුරු දියහැකි බව මහවග - චීවරක්ඛන්ධයෙහි සඳහන් ය. එය මෙසේ ය. "***අට්ඨිමා භික්ඛවේ, මාතිකා චීවරස්ස උප්පාදය, සීමාය දෙ ති. කතිකාය දෙ ති. භික්ඛාපඤ්ඤත්තියා දෙ ති. සංඝස්ස දෙති උභතො සංඝස්ස දෙති. වස්සං වුත්ථසංඝස්ස දෙති. ආදිස්ස දෙති. පුග්ගලස්සදෙති*** "[3] එයින් කියැවෙන්නේ සිවුරු ලැබීමට හේතු වූ කරුණු අටක් ඇති බවකි. එහි දෙවැන්න "කතිකාවෙන් දෙයි" යන්නයි. භික්ෂූන්වහන්සේලාගේ ඇතැම් 'කතිකා' දුකුළා ඇවැත් වන්නේ යැයි ද බුදුන්වහන්සේ වදළහ. "***න භික්ඛවේ, එවරූපා කතිකා***



***කාතබ්බා අන්තරාවස්සං න පබ්බාජෙතබ්බන්ති යොකරයොය ආපත්ති දුක්කටස්සති***"[4] *(මහණෙනි, වස ඇතුළත දී පැවිදි නොකොට යුතුය'යි මෙබඳු කතිකා නොකට යුතු ය. යමෙක් කරන්නේනම් දුකුළා ඇවැත් වේ).*

බුදු බව ලැබ ඉසිපතනයේ මිගදයට උන් වහන්සේ වැඩම කළ ප්‍රථම දිනයේ දී එහි සිටි පස්වග තවුසන් බුදුන් වහන්සේ වෙනුවෙන් ඇතිකරගත් කතිකාව පෙළෙහි සඳහන් වනුයේ "සණ්ඨපෙසුං" යන වචනයෙනි (***භගවන්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන අඤ්ඤ මඤ්ඤං සණ්ඨපෙසුං***). පෙළට අරුත් සපයයන තැන "සණ්ඨපෙසුං" යන වචනයට 'කතිකාවක් ' යන්න එහි යෙදේ.[5]

භාග්‍යවතුන් වහන්සේ පස්වග මහණුන් වෙත එළඹෙත් එළඹෙත්ම පස්වග මහණුන් සිය කතිකාවෙහි සිටින්නට නොහැකි වූහ.[6] ***( තෙ පඤ්චවග්ගියා භික්ඛු නාසක්ඛිංසු සකාය කතිකාය සණ්ඨාතුං)***. තවත් තැනෙක කතිකාව සම්බන්ධයෙන් මෙසේ සඳහන් වෙයි. එසමයෙහි සැරියුත් මුගලන් පරිබ්‍රාජක දෙදෙන සඤ්ජය පරිබ්‍රාජක තෙමේ ඇසුරේ වසන කල ප්‍රථමයෙන් නිර්වාණය ලත් අය අනෙකාට එය සැලකළ යුතුයැයි කතිකාවක් ඇතිකර ගත්හ.[7] ***(තෙන ඛො පන සමයෙන සාරිපුත්ත මොග්ගල්ලානා සඤ්ජයෙ පරිබ්‍රාජක බ්‍රහ්ම චරියං චරන්ති තෙහි කතිකා කතා හොති)***.[8] කතිකා යන වචනය පාලියෙන් නිපන් එකක් බව මින් පහැදිලි වෙයි. සිංහලයෙන් යෙදෙන කතිකාවත් යන්න කතිකා කීපයක් යන අරුත දක්වයි.

### ලක්දිව කතිකාවත්

දෙදෙනකු හෝ එයට වැඩි පිරිසක් හෝ එකතු වී ඇති කරගනු ලබන සම්මුතිය කතිකාවත වේ. ලංකාවේ කතිකාවත් ප්‍රධාන වර්ග දෙකකි.

01. විහාර කතිකාවත්.

02. ශාසන කතිකාවත් යනුවෙනි.

## විහාර කතිකාවත්

01. පස්වන කාශ්‍යපරජුගේ අනුරාධපුර පුවරු ලිපිය.
02. වෙස්සගිරි පුවරු ලිපිය.
03. උදමහයාගේ පුලියන්කුලම ලිපිය.
04. හතරවන සේන රජුගේ කළුදිය පොකුණ ලිපිය.
05. හතරවන මිහිඳු රජුගේ අභයගිරිය පුවරුලිපිය අංක 02
06. හතරවන මිහිඳු රජුගේ වෙස්සගිරිය පුවරුලිපිය අංක 02.
07. හතරවන මිහිඳු රජුගේ මිහින්තලා පුවරුලිපිය අංක 01.
08. හයවන පරාක්‍රමබාහුගේ පැපිළියාන ශිලාලේඛනය.

## ශාසන කතිකාවත්

01. පොළොන්නරුවේ ගල්විහාර ලිපිය හෙවත් මහා පරාක්‍රමබාහු කතිකාවත.
02. පොළොන්නරුවේ හැටදාගේ පුවරු ලිපි හෙවත් නිශ්ශංකමල්ල කතිකාවත.
03. දඹදෙණි කතිකාවත.
04. හයවැනි පරාක්‍රමබාහු කතිකාවත.
05. කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත.
06. ශ්‍රී රාජාධිරාජසිංහ කතිකාවත.[9]

ආචාර්ය ඒ. වී. සුරවීර සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය මැයෙන් පළකළ කෘතියේ ලක්දිව කතිකාවත් සම්බන්ධයෙන් ඉහත ශීර්ෂ යටතේ කරුණු ගොණුකර තිබේ. එහි ම උපග්‍රන්ථ යටතේ අද්‍යතන කතිකාවත් මැයෙන් පහත සඳහන් කතිකාවත් ද දැක්වෙයි.

01. මහනුවර උපෝසථපුෂ්පාරාම විහාරස්ථ අභිනව කතිකාවත.[10]
02. අමරපුරාගත කල්‍යාණිවංශ නිකායේ කතිකාවත්.[11]
03. රාමඤ්ඤ නිකායේ කතිකාවත.[12]

මෙහි අංක එක දරන කතිකාවත මහනුවර උපෝෂථපුෂ්පාරාම මහාවිහාරස්ථ කාරක මහා සංඝ සභාව



සම්මත කරගත් අභිනව කතිකාවත නම්වූ කතිකාවත වන්නේ ය. මෙය මල්වතු පාර්ශවයේ භික්ෂූන් වහන්සේලාගේ සංඝ සමගිය සහ ප්‍රතිපත්ති වර්ධනය අරබයා ඇතිකරගනු ලැබූ කතිකාවතකි. දීර්ග කතිකාවක් වන මෙහි අවසානය මෙසේ ය. "මෙසේ මෙම කතිකාවත සම්මතකොට ස්ථිර කරන්නට යෙදුනේ ශ්‍රී බුද්ධ වර්ෂ ප්‍රමාණයෙන් දෙ දහස් සාරසිය **සුසැට** (2464) වන්නට පැමිණි **මර්කට** සංවත්සරයෙහි වප්පුර පසලොස්වක් නම් තිථිය ලත් බුදදින කාරක මහාසංඝ සභාවේ ස්ව කැමැත්ත ලෙස මහනුවර උපෝසථපුෂ්පාරාම මහවිහාර පදවිය කරවන අමුණුගම රජගුරු ශ්‍රීනිවාස පියදස්සාභිධාන මහනායක ස්ථවිරයන් වහන්සේ වම්හ. වර්ෂ 1920ක් වූ ඔක්තෝබර් මස 7වෙනි බුදදින දීය" යනුයි.[13]

දෙවැන්නට අයත් කතිකාවත කෙටි කතිකාවතකි. මෙය අමරපුර නිකායෙහි භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ඇතිකරගන්නා ලද සම්මුතියකි. එහි අවසානයේ මෙසේ සඳහන් වෙයි. " **මත්තෙහිදු** අපේ මේ නිකාය අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්තින් විරහිත බොහෝ කාලයක් මුලුල්ලේ අකලංක සඬස සාමග්‍රීන් යුක්තව පවතීවා"[14] යනු මාගේ ප්‍රාර්ථනාවයි. මගේ මේ ප්‍රාර්ථනාව මුදුන්පත් කරන අදහසින් ලක්දිව තත්කාල ශාසනානුශාසන මහාස්ථවිරයන් වහන්සේලා විසින් විනයනය හකුළුවා කරන ලද පුරාණ කතිකාවත් මුද්‍රණය කරවා අප නිකායේ භික්ෂූන් අතට දීමට කල්පනා කළෙමි. මේ කතිකාවත් පොහොයෙන් පොහොය තම තමත් හෙරණ පැවිදි, මහලු පැවදි ලත් ශිෂ්‍යයන්ට කියවා මනා කොට තේරුම් කරදීමද, තෙරෙණුන් පටන් හැම දෙනම මෙම කතිකාවත් වනපොත් කොට ධාරණය කිරීම හා තදානුකූලව පැවැත්මද කළයුතුය." යන මාගේ ප්‍රධාන අනුශාසනාවයි.

මේ බවට ඃ ආරියවංසාලංකාර
සාසනධර විද්‍යාචරිය
පියරතන තිස්සාභිධාන නායක ස්ථවිර.

ශ්‍රී බුද්ධ වර්ශයෙන් 2450ක් වූ පුරපසලොස්වක් ලත් හිරු දින දොඩංදූව ශෛලම්බාරාමයේ දීය. යනුයි අනුසාසයානුය සහිතව "පූරාණ කතිකාවත්" නමින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධකර ඇත්තේ පොළොන්නරු, දඹදෙණි කතිකාවත් දෙක බවත් එය ක්‍රි. ව. 1906 දී අම්බලන්ගොඩ විද්‍යා ප්‍රකාශ යන්ත්‍රාලයෙන් මුද්‍රණය කරවා ඇති බවත් ආචාර්ය ඒ. වී. සුරවීර සඳහන් කරයි.[15]

අද්‍යතන කතිකාවත් යටතේ අංක තුනට අයත් ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායේ කතිකාවත එම නිකාය ආරම්භ වීමෙන් පසුව ඇති කරගන්නා ලද්දකි. එම නිකායේ භික්ෂූන් වහන්සේලාගේ විනය කටයුතු සම්බන්ධයෙන් ප්‍රධාන කාරණා දහයක් යටතේ සම්මුති කරගත් මෙම කතිකාවත අවසානයේ මෙසේ සඳහන් වෙයි. "ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකාය ප්‍රතිසෂ්ඨාපක සාසනවංශ කවිධජ සිරි සද්ධම්මාචරියයන් සංඝපති ඉන්දාසභවරඥානසාමි මහානායක මාහිමිපාණන් වහන්සේ පුවක්දණ්ඩාවේ පඤ්ඤානන්ද මාහිමිපාණන් වහන්සේ ඇතුළු මූලික මහා ස්ථවීරයන් වහන්සෙලා විසින් බුදු වසින් 2415 වැන්නෙහි සම්මත කරණ ලද රාමඤ්ඤ නිකායේ කතිකාවත මෙතකින් නිමියේයි". යනුයි[16]

මෙහි දක්වන ලද අද්‍යයතන කතිකාවත් ඇතිකළ කාලවකවානු මෙසේ ය.

| | |
|---|---|
| අභිනව කතිකාවත මල්වතු විහාරය | රා. ව. 1920 |
| අමරපුරාගත කතිකාවත | රා. ව. 1906 |
| රාමඤ්ඤනිකාය කතිකාවත | රා.ව 1872 |

අද්‍යතන ඇතැම් කතිකාවත් සම්බන්ධයෙන් වාද විවාද සිදුවූ බව ***කතිකාවත් සඟාරා වාදය*** [17]*කෘතියෙන් පැහැදිලි වෙයි. .*

**ඉහත කතිකාවත් ත්‍රයට අමතරව මහනුවර දී සම්මත කරගත් තවත් කතිකාවත් ත්‍රයක් තිබේ. එම කතිකාවත් ත්‍රය මෙසේ ය.**

**01. උපාලි කතිකාවත.**

**02. ශාසනාභිවෘධි වර්ධන කතිකාවත.**

**03. පරම ධම් කතිකාවත.**[18]



මෙම කතිකාවත් ත්‍රය පිළිබදව දිගු විස්තරයක් ආචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමියන්ගේ පර්යේෂණ කෘතියේ පිටු අංක 30 - 60 අතර අන්තර්ගත වෙයි. උපාලි කතිකාවතට අදාළ පුස්කොළ පිටපත තිබෙන තැනක් හඳුනාගැනීම අසීරු ය. ශාසනාභිවෘධි කතිකාවතෙහි පිටපතක් අධිනීතිඥ වෝල්ටර් විමලචන්ද්‍ර මහතා සතුව පැවති බව ආචාර්ය තුඹුල්ලේ සීලක්ඛන්ධ හිමියෝ සඳහන් කරති.[19] උන්වහන්සේ සඳහන් කරන පරිදි එය පත්ඉරු 44ක් සහිත පිටපතකි. එහි ඇති කතිකා ශීර්ෂ 23කි. ඉහත පරම ධර්ම කතිකාවතෙහි පුස්කොළ මුල් පිටපත් තිබෙන ස්ථානයක් උක්ත ස්වාමීන් වහන්සේගේ කෘතියේ සඳහන් නො වෙයි. මෙහි ඡායස්ථිත පිටපතක් පිළිබඳව පූර්වෝක්ත ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ සිය කෘතියෙහි අන්තර්ගත කරති.[20] එමෙන් ම මහාචාර්ය පූජ්‍ය කුඹුරුගමුවේ වජිර හිමිපාණෝ සිය දළදා සංස්කෘතිය කෘතියෙහි උපග්‍රන්ථයේ මේ කතිකාවතේ සඳහන් දළදා වහන්සේ සහ අස්ගිරි මහවිහාරිය මහනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ භාරකාරත්වය ගැන සඳන් කරති. ඒ සඳහා මූලාශ්‍රය ලබාගෙන ඇත්තේ ද පෙර සඳහන් ඡායස්ථිත පිටපතිනි.[21] මෙකී කතිකාවතෙහි පුස්කොළ මුල් පිටපත අස්ගිරි විහාරයේ මැදපන්සලේ අධිපති ගල්ලෑල්ලේ සරණංකර හිමිගෙන් 2006. 03. 11වන දින ලබාගෙන පරික්ෂා කළෙමි. අනතුරුව ඒ වනවිට මා අත තිබූ යතුරු ලියන පිටපත සමඟ එම පුස්කොළ පිටපත සන්සන්දනය කෙළේ ය. එකී යතුරුලියන පිටපත අප වෙත ලබාදෙන ලද්දේ එවකට සහකාර ලේඛනාරක්ෂකව මහනුවර ලේඛනාරක්ෂක දෙපාර්තමෙන්තුවේ සේවයේ නිරතව සිටි මුතුවත්ත මහත්මිය විසිනි. එම යතුරුලියන පිටපත හා පුස්කොළ පිටපතෙහි අන්තර්ගතය එක සමාන බව පැහැදිලි විය. අස්ගිරි පරමධර්ම කතිකාවත පිළිබඳව භෞතික විස්තරය මෙසේ ය.

| | |
|---|---|
| දිග | -: සෙ.මී. 45 |
| පළල | -: සෙ.මී. 05 |
| අඟලකට අකුරු | -: 6-7 ප්‍රමාණ |

ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය
23 JUL 2019
පුස්තකාලය


කම්බා -: දැව , ලාක්ෂාකර්මයෙන් මෝස්තර ගන්වා ඇත. කලු, රතු, කහ වර්ණ වේ. පලාපෙති හා මල්මෝස්තර සහිතයි.

සකිය -: සෙ.මී. 03 ක් විශ්කම්භය වූ පිත්තල නෙලුම් මලක්

හුය -: පුස්කොළ පොත් හුයයක් (පැරණිය)

අංකනය -: අ, ආ ආදී අක්ෂර පිළිවෙල අනුවයි. පත්ඉරු දෙපැත්තම අංකනය කර ඇත. එනම් මුල් මුල්පැත්ත " අ" ලෙසත් යටිපැත්ත "ආ" ලෙසත්ය. එයට අමතරව පහළ දකුණු කෙලවරේ අරාබි ඉලක්කමෙන් 1 - 2 පිළිවෙලට අංක යොදා ඇත.

ආරම්භක පත් ඉරුවේ මුල් පැත්ත




නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුධස්ස



"පරමධම් කතිකාවත" ලියන්නට හේතු වූ පසුබිම මේ කතිකාවතේ පූර්ණිකාව වශයෙනුත් වගන්ති 188ක් කතිකාවත වශයෙනුත් එහි අන්තර්ගත වෙයි. මෙම කතිකාවත සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකාවක් " The 3rd International Conference" යන සම්මන්ත්‍රනයේ දී අනුරපුර භික්ෂු විශ්වවිද්‍යාලයේ දී 2008.10.08 දින ම විසින් ඉදිරිපත් කරන ලදි. එයට අදාළ සාරසංග්‍රහය එකී සම්මන්ත්‍රණ පත්‍රිකා පොතෙහි ද පළවිය.[22] මෙම කතිකාවත සම්බන්ධයෙන් අවස්ථා කීපයකදී තොරතුරු සොයාගත් නමුත් ඒවා කිසියම් ආකාරයෙකින් පළ කරන්නට නොහැකි විය. ඇතැම් කරුණු තව ද පැහැදිලි කර ගැනීමට තිබෙයි. පරමධර්ම කතිකාවත ඇති කිරීමට හේතු වූ පසුබිම එහි පූර්විකාවෙන් දැක්වෙන්නේ පහත සඳහන් පරිදි ය.

*ශ්‍රීමත් ශ්‍රී ඝන අප ගෞතම ශ්‍රී ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ ලොව පහලවන්ඩ පෙර සහ ධරමාන කාලයෙහිත් ඉන් මෑත කාලවලත් ගිහි පැවිදි සමූහයා පිළිබඳද නානාවිධ සභා ලොව පැවති බව ''ගච්ඡ ත්වං ආනන්ද යාවතිකා භික්ඛු රාජගහං සන්නිපාතෙහි'' යි අංගුත්තර නිකායර්ථකථාවෙහි ද සොඳින් ප්‍රකාශව ඇත්තේමය*

*තවද සාමාග්‍රී සමාගම් මාර්ගයෙන්ම තමන් වහන්සේගේ ශ්‍රාවක සංඝයා පිළිබඳ සමාග්‍රී භාවය ආදී අප්‍රමාණ ගුණ ධම් වර්ධනය පිණිස බුදුරජානන් වහන්සේම සාමාන්‍යයෙන් පණවා වදාළ සමාගම් මාර්ගය මසකට දෙවර හෙවත් පසළොස් දිනෙන් දින බුද්ධ නියමය ලෙස මේතාක් පවත්වාගෙන එන්නාසේම මතුවටත් අඛණ්ඩව පවත්වන්ඩම ඕනෑයම*

*ඒ හැර ලක්දිව පැවති සිංහල රාජවංශය පිරිහීගිය නිසා ඇතිකරගත් වඩුග රාජවංශයත් සිංහල රාජ ධර්මය ලෙසම ශාසනාරක්ෂාව කිසි ඌණත්වයක් නැතුව පවත්වාගෙන එන අතර ස්වදේශවාසී සිංහල ජනයාට අප්‍රමාණ විපත් සිදුවන්ඩත් රජ අණ සිංහල ජනයාට පමණක් පවත්නා වාගේ හිතන්ඩත්*

පෙනෙන්ඩත් වූ නිසා රාජ්‍ය වාසීන් ශ්‍රී වික්‍රම රාජසිංහ රජු කෙරෙහි කලකිරෙන්ඩ යෙදුනා ඇතම෴

එසේ එන වඩුග රජ අණට වඩා ඉංග්‍රීසි රජ අණ සාධාරණ බව ද සත්‍යවාදීකම ද රට පාවාදී විසිපස් වසක් ඇතුළත අප ලවාම උඩරට ආණ්ඩුකරවන සම්මත ආණ්ඩුවක් ඇති කර දී ඉංග්‍රීසි ජනයා පහත රට පමණක් ආණ්ඩුකරන බවට ගොවැර්ණදෝරු උතුමානන් වහන්ශේ දේවස්ථානේදී දිවුළා යයි ඇහැලේ පොලේ තිලමේ පත් හසුන්වල ලියා කියා උඩරට වාසී රදළ වරුන්ඩ පත් හසුන් එව්වායම෴

මෙසේ රදළ වරුන්ගේ මාර්ගයෙන් උඩරට වාසීන් සිත්ගෙන සංඝයාටත් ඒ සියල්ල ඒත්තුගන්නවා ඉංගලන්තේ මහ රජ උතුමා අපෙත් මහරජ උතුමා ලෙස භාරගන්නා හැටියට විත්‍රසන්තාන පත්‍රයක වර්ෂ එක්වා දහස් අටසිය පසළොසක් වූ මාර්තු මස දෙවනි දින අපරභාග තුනේ කතිසමට දෙපක්ෂය විසින් අත්සන් පිහිටුවා සවස්ථිර කරගන්ඩ යෙදුනායම෴

එම සන්තාන පත්‍රයේ පස්වෙනි වගන්තියේ බුද්ධාගම සම්බන්ධව පවත්වන්ඩ ඕනෑව තිබෙන පුරාණ සිට පවත්වාගෙන ආ නම්බු සිරිත් චාලිත්‍ර සහ බුද්ධාගම සතු සියළු දේපොල ආණ්ඩුව විසින් සොඳින් ආරක්ෂා කර දෙන හැටියට ගිවිසගන්ඩ යෙදුන බැවින් ඇදහීම නැතත් පුරාණ සිරිතට එකඟව ආණ්ඩුවේ මැදිහත්කම් ඇතුව බුද්ධාගමේ සිරිත් චාලිත්‍ර ඛණ්ඩනොකොට පවත්වාගෙන ආවායම෴

එසේ අවුත් වර්‍ෂ 1845 ක් වූ අප්‍රේල් මස 23 වෙනිදින ගරුතර ගොවැර්ණදෝරු උන්නාන්සේ මහනුවර ගමන් මාලිගාවට මේ උභය විහාරේ සංඝයා සහ රදළවරුන් සම්මුඛීභූත කරවා මහනුන්නාන්ශේලාට නායක ධානාන්තර පත් කිරීමේදී ආණ්ඩුව විසින් වෙන මැදහත්කමින් අහක්වීමට ආණ්ඩුව කැමැත්ත ඇති බවද එවකට අස්ගිරි විහාරේ පුරප්පාඩු ගණනේ තිබුන නායක ධානාන්තරයට යෝග්‍ය කෙනෙකු මෙම අස්ගිරි



විහාර වාසී සංඝයා විසින්ම තෝරා පත් කර ගන්ඩ ඕනෑයයි ද, දළදා වහන්සේ භාරගෙන අරප්‍රවේසම් කිරීමටත් එසේම එලියට වැඩම වීමේදී නිසි විධාන සලසා ගැනීමට ගිහි පැවදි සම්මුතියක් පත්කර ගන්නා ලෙසත් නියමයක් කරන්ඩ යෙදුනායම෴

එහෙත් ඒ රැස්වූ සම්මුතිය දළදා වහන්සේ පිළිබඳද නියමය හැර ඉතුරු සියල්ල නො පිළිගන්ඩ යෙදී මහනුවර උභය විහාරවාසී සෑම සංඝයා සහ රදළවරුන් විසින් ඒකමතිකව බුද්ධාගමේ පවත්වන්ඩ ඕනෑව තිබෙන අන්දම සහ කාරණා යෝජනාකර ලියා තියා උතුම් ඉංග්‍රීසි ආණ්ඩුවට ඔප්පු දුන්නාය ම෴

ඉන්පසු ගරුතර ගොවර්ණදෝරු උන්නාන්සේ ඒ කාරණා ඒත්තුගෙන අප විසින් ඔප්පු කරන්ඩ යෙදුන කාරණා විස්තරයෙන් නම නියමකර එවන පිණිස එංගලන්තේ මහා රාජෝත්තමින් වහන්සේගේ ආණ්ඩුවට යවන්ඩ යෙදුන බව දන්වා වර්‍ෂ 1847 ක් වූ ඔක්තෝම්බ්‍ර මස 2 වෙනි දින ලකුණු කළ ලේඛනයක් අපවෙත එවන්ඩ යෙදුනායම෴

එසේ යවන්ඩ යෙදුන ඒ රපෝර්තුව බලා නෛකශ්‍රීන් විරාජමාන වීරවික්‍රම ප්‍රතාප තේජෝබල පරාක්‍රම අති උතුම් වික්ටෝරියා මහාරාජෝත්තමින් වහන්සේ විසින් මෙම ශ්‍රී ලංකාද්වීපයෙහි බුද්ධාගම සම්බන්ධව පැවති ප්‍රශ්නය අන්තිම වරට සාධාරණ අන්දමින් යහපත්ව විසඳා ගරුතර ගොවැර්ණදෝරු උන්නාන්සේට දන්වන්ඩ යෙදුනායම෴

ඒ දැන්වූ ප්‍රකාර වර්‍ෂ 1853 ක් වූ අප්‍රේල් මස 07 වෙනි දින ලකුණු කළ නොම්මර 152, දරන මහා රාජාඥා පත්‍රයෙන් ලක්දිව බුද්ධ ශාසනය සහ දළදා වහන්සේ සම්බන්ධවත් නායක ධානාන්තර පත්කිරීම පිළිබඳවත් ඒතාක් ආණ්ඩුවට තිබුණමැදහත්කමෙන් අනුමතය හැර ඉතුරු සියලු බලය මහනුවර අස්ගිරි මල්වතු යන උභය විහාරවාසී මහ සංඝයා වහන්සේලාට වෙන් වෙන් වශයෙන් භාර දෙන්ඩ යෙදුනාය

මෙසේ මහා රාජාඥ පණත ලැබුණාට පසුව මෙම අස්ගිරි විහාරයෙහි පුරප්පාඩු පැවති මහනායක ධානාන්තරයට යෝග්‍ය සථවිර දෙනමක් තෝරා ගැනීමේ විභාගය සඳහා වර්‍ෂ 1853 ක් වූ මැයි මස 11 වෙනි දින අස්ගිරි විහාරේ මහ පෝයගෙට රැස්වෙන්ඩ යෙදුන සංඝයා වහන්සේලා 75 නමින් 4 නමක් එම මහනායක ධානාන්තරය පිණිස ආයාචනා පත්‍ර ඔප්පුකර සිටි තැනේදි ඉතුරු 71 නම් මහ සඟ සම්මුතිය සැදී ගොඩමුන්නේ සිද්ධාර්ථ උන්වහන්සේ සහ වැල්ලව අත්ථදස්සී උන්වහන්සේද පොතුහැර රතනපාල උන්වහන්සේද පිටියේගෙදර චන්දජෝති උන්වහන්සේද පේරාදෙණියේ ඉන්දජෝති යන ධර්‍ම විනේධර දැනමිති මේ පස්නම එවේලේම තෝරා ඒ පිළිබඳ ක්‍රත්‍ය භාර මහසඟ සම්මුතියෙන් භාරදෙන්ඩ යෙදුනායමැයි

ඉන්පසු ආයාචනා පත්‍ර 4 කියවා ඒ 4 නමගේ යෝග්‍යකම් මහ සම්මුතියේ ප්‍රකාශකොට නැවත කර වදාළ සම යෝජනාව මහසඟ සම්මුතියේ සෑම සංඝයාම මැනවයි පිළිගෙන තම කැමැත්ත අත්සනින් තබා යටවත්තේ සුවර්ණජෝත්‍යාභිධාන උන්වහන්සේ මහානායක ධානාන්තරයටද,

එසේම බදුළු මුතියංගන විහාරේ ප්‍රධාන කමත් සමග පැපලේ අත්ථදස්ශ්‍යාභිධාන උන්වහන්සේ අස්ගිරි විහාරේ දෙවනි නායක ධානාන්තරයටද මහ සම්මුතියේ තෝරා සම්මතකර වර්‍ෂ 1853 ක්වූ මැයි මස 17 වැනි දින අස්ගිරි විහාරේ මහ සඟ සම්මුතියේ ප්‍රථම රපෝර්තු මහනුවර කච්චේරියට ඔප්පුකරන්ඩ යෙදුනා ඇත මැයි

මෙසේ එන අතර යටවත්තේ සුවණ්ණජෝති මහානායක ස්ථවීර වරෝත්තමයන් වහන්සේ අස්ගිරි විහාරවාසී සමහර තැන්වලට නො දන්වා නො කැඳවා අස්ගිරි විහාරවාසී සමහර තැනුත් කැඳවා වගීවු සමාගමකින් අළුත්විහාරෙ සහ සුදුහුම්පොල විහාරෙත් නායක පදවි තෝරා නියම කර වර්‍ෂ 1857ක් වූ අප්‍රේල් මස 29 වෙනි දින කළ රපෝර්තුව නීති විරෝධී ලෙසින් කළ නිසා බාර නොගන්නා ලෙස කාරණා ලියා වර්‍ෂ



1857 ක්වූ ජූලි මස 13 වෙනි දින අස්ගිරි විහාරේ දෙවෙනි නායක ස්ථවිර වරෝත්තමයන් වහන්සේ විස්තර මහනුවර කච්චේරියට රපෝර්තුකර සිටින්ඩ යෙදුනායමැයි

මහනුවර වංශාධිපති ආර්. පෝවර් මහ ඒජන්ත උන්නාන්සේ විසින් ඒ සියළු කාරණා ඒත්තුගෙන වර්‍ෂ 1857 ක්වූ ජූලි මස පසළොස් වෙනි දින ලකුණුකල නොම්මර 1078 දරන උපදේශ පත්‍රයක් අස්ගිරි විහාර වාසී සංඝයා වාහන්සේලාට එවන්ඩ යෙදී මෙබඳු අර්බුද මතු සිද්ධ නොවෙන්ඩ ඕනෑ නිසා කතිකාවතක් සම්මත කර ගන්නා ලෙසට බොහෝ සේ අවවාදුපදේශද ලැබුණායමැයි

කතිකාවතක් ඇතිකර ඒ අනුව කුදු මහත් පිළිවෙත් පිරිම ශාසනික සිරිත් නිසාත් මතු අර්බුද ඇති නොවී සංඝයාගේ සාමග්‍රියට ප්‍රතිෂ්ඨාධාරද ආණ්ඩුවේ නීති ප්‍රකාර පවතින්ඩ ඕනෑ නිසාත් සුදුස්සන් හා කථාකර <u>ධර්‍ම විනයානුකූල කතිකාවතක්</u> සම්මතකර ගැනීමේ විභාගයට නේවාසික සියළු සංඝයා ඇතුළු අස්ගිරි විහාර පාර්ශ්වයට අයත් ප්‍රධාන විහාරස්ථානවල ප්‍රධානවරුන් වහන්සේලාටත් දන්වා වර්‍ෂ 1857 ක්වූ අගෝස්තු මස 15 වෙනි දින අස්ගිරි විහාරේ මහ පෝයගෙට මහත්ම සංඝ සම්මුතියෙනිමැයි

මෙසේ සිව් දිසා හා සත් රටෙන් වැඩ වදාළ අපේ සංඝයා හා මෙහි නේවාසික මහානායකෝපනායක දෙනම ප්‍රධාන සූතිස්නම සාමග්‍රී සමාදර ඇතිව වැඩ හිඳ ප්‍රිය කථා ශීලීව සාකච්ඡාකර මෙම අස්ගිරි විහාරයෙහි පවත්වාගෙන ආ සිරිතුත්, ඉහත කී නොම්මර 152 දරන මහාරාජඥා පණත කරණකොටගෙන මින්මතු පවතින්ඩ ඕනෑ අන්දමත් මේ විහාර සභාව පවත්වන්ඩ ඕනෑ අන්දමත් සංඝයා පිළිපැදිය යුතු අන්දම සහ ලැබෙනදේ බෙදාදී වැළඳිය යුතු විධියත් දළදා තේවමුර බාරදෙන විධිය සහ ශාසනික ශාම ධානාන්තර වලටම යෝග්‍ය තැන් තෝරා ගතයුතු විධියත් මේ මහ විහාරයෙහි සහ මෙම පාර්ශ්වයෙහි සබ්‍රම්රුන් වහන්සේලාගේ අන්‍යෝන්‍ය සමාශ්‍රිය

*ඇති වන සේ පිළිපැදිය යුතු විධියත් වේ. මේ සිරිත් නියමකර තැබුවොත් හොඳයි කියා සුදුස්සන් හා කථා සංසන්දනය කොට ඉක්බිතිව මෙම අස්ගිරි විහාර සභාවට "පරමධර්‍ම" යන උතුම් ශ්‍රී නාමය ඒම හා සම්මුතියෙන් තබා වදාළායම෴*

*එසේ නම් තබා කොටගල්ඹළුවේ ගුණරතන ස්ථවිරයන් වහන්සේ සහ යටවත්තේ චන්ද්‍රජෝති ස්ථවිරයන් වහන්සේද යන දෙනම යෝජනා හා ස්ථිරකළ ඉක්බිති මහ සඟ සම්මුතියේ සමානාභිමතයෙන් බදුළු මුතියංගන විහාරේ ප්‍රධානත්වයත් සමඟ අස්ගිරි විහාරේ දෙවෙනි නායක ස්ථානාන්තරය ලැබී කරවන පැපලේ අත්ථදස්සි ස්ථවිරයන් වහන්සේද, බම්බා විහාරේ ලැබී තිබෙන වත්තේගම සුමංගල ස්ථවිරයන් වහන්සේද මහියංගනේ පදවිය ලැබී තිබෙන ඉඳවළුගොඩ ධම්මපාල ස්ථවිරයන් වහන්සේද, පොතුහැර රතනපාල ස්ථවිරයන් වහන්සේද, වැල්ලව අත්ථදස්සි ස්ථවිරයන් වහන්සේද, පිටියේගෙදර චන්ද්‍රජෝති ස්ථවිරයන් වහන්සේද, පේරාදෙණියේ ඉන්ද්‍රජෝති ස්ථවිරයන් වහවන්සේද, යන ධර්ම විනේධර දැනමිති සත්නම ව්‍යවස්ථා කාරක කමට සම්මත කර ගන්ඩ යෙදුනායම෴*

*ඊට ඉක්බිතිව එම ව්‍යස්ථාකාරක සම්මුතිය විසින් බුද්ධ දේශනාවටත්, රාජාඥාවටත් පුරාණ කතිකා වලටත් ආවේණිකව පවත්වාගෙන එන දැහැමි වත් සිරිත් වලටත්, එකඟව කථා සංසන්දනයකොට ධර්‍ම විනයානුකූල ලෙස සම්පාදනයකර ඔප්පු දෙන්ඩ යෙදෙන "පරමධර්ම" කතිකාවතේ වග හැටි නම෴ යනු යි.*

විමසුම

අස්ගිරි මහාවිහාරයීය පරමධර්ම කතිකාවත බිහිවීමට ප්‍රධාන කාරණය කතිකාවතෙහි පූර්විකාවට අනුව පැහැදිලිය ( පූර්විකාවෙහි ඡේදය 15 ). එකී කටයුත්ත මහනුවර මහ ඒජන්තවරයාට සැලවූයෙන් එවැනි අර්බුද ඇති නොවනු පිණිස කතිකාවතක් සම්මතකර ගන්නට 1857. 07. 15 දාතමින් යුත් ඔහුගේ 1078 අංක දරන ලිපියෙන් උපදෙස් ලැබී ඇති බව



පූර්විකාවෙහි 16 ඡේදයෙන් කියැවෙයි. මේ සම්බන්ධයෙන් එංගලන්ත මහරැජින වූ වික්ටෝරියා මහරැජිනගේ අවසර ලැබී තිබෙයි. ඒ අනුව ධර්ම විනයානුකූල කතිකාවතක් සම්මතකර ගන්නට කටයුතු කළ බව සහ අස්ගිරි විහාර සභාවට **පරමධර්ම** යන නාමය සම්මත කළ බව එහිම සඳහන් වන්නේ ය.

කතිකාවත සැකසීම සඳහා ධර්මධර වියධර හිමිවරු සත් නමක් යෝජනා ස්ථිරත්වයෙන් පත්කැර තිබේ. 1857.08. 15 දින සිට කතිකාවත සම්පාදනයවී ඇති අතර මෙය සම්මතවී ඇතතේ ක්‍රි. ව. 1858. 07. 19වෙනි දින අස්ගිරි මහාවිහාරයීය උපෝෂථාගරයේ දී ය. මෙම කතිකාවත අවසානයේ සඳහන්වන්නේ ඉහතකී පනත වශයෙනි. එවකට වැඩ සිටි මහානායක ස්වාමින්ද්‍රයන් වහන්සේ සහ අනුනායක ස්වාමින්ද්‍රයන් වහන්සේ දෙනම අත්සන් තබා ඇත්තේ උන්වහන්සේලාගේ ග්‍රාම නාමවන **යටවත්තේ** සහ **පැපලේ** යනුවෙනි. පරම ධර්ම කතිකාවත බුද්ධ දේශනාවටත්, රාජාඥාවටත්, පුරාණ කතිකාවත්වලටත් ආවේණිකව එන වත් සිරිත්වලට අනුකූලව සකසනු ලැබූ සම්මුතියක් බව මෙහි පූර්විකාවේ අවසන් වැකියෙන් පහැදිලි වන්නේ ය.

මෙම කතිකාවතෙහි වගන්ති 188ක් අන්තර්ගත වෙයි (අංකනය කර නැත). ඒ තුළ භික්ෂූන් වහන්සේගේ දිනචරියාවට අයත් ඇතැම් කරුණු, පෝයගේ සහ සිරිත්, විනය කර්ම කටයුතු, භික්ෂූන් වහන්සේ විසින් නොකළ යුතු දේ, සාංඝික දේපල පරිහරණය, දළදා මාලිගයේ තේවා මුරය බාරගැනීම, නායක ස්ථානාන්තර පත්කිරීමේ ක්‍රම, විහාරයට ලැබෙන ආදායම ලේඛනගත කිරීම සහ භාවිතය, ලේඛනාධිකාරී හිමි සහ මහනායක හිමිගේ කාර්යය භාරය ඇතුලුව තව ද කරුණු දක්නට ඇත. භික්ෂූන් වහන්සේලාගේ ශ්‍රමණ සාරුප්‍යයට නොගැලපෙන යම්දේ එසමයෙහි සිදුව ඇති සෙයක් මෙහි සඳහන් සමහර කරුණු අනුව සැකකළ හැකි ය. කතිකාවෙහි වගන්තිය 42 සිට 58 වගන්තිය බැලීමෙන් එය වඩාත් තහවුරුවනු ඇත.

අස්ගිරි මහාවිහාරයේ කාරක සංඝ සභාවට පත්කැරගන්නා වූ අය ධර්ම විනය හොඳින් දැන සිටින මහතෙරුන් විය යුතුය යන්න මෙහි අවධාරණය කරයි. උන්වහන්සේ දළදා මාලිගයේ පවත්වන්නට ඕනැකරන චාරිත්‍ර දන්නා කෙනෙකු ද වියයුතු ය යන 110 වගන්තියෙන් පෝයගෙහි සහ දළදා මාලිගයේ කටයුතු කිරීමට පරිචයක් ඇති අය කෙරෙහි විශේෂත්වයක් දක්වා ඇති බව පැහැදිලි වෙයි.

මහානායක ධානාන්තරය පුද්ගලික ධානාන්තරයක් නොවන බව 133 වගනතියෙන් කියැවෙයි. උන්වහන්සේ සභාගත කටයුතුවල දී මිත්‍රකම් පැවැත්වීම සහ පක්ෂග්‍රාහී නොවිය යුතුය යනුවෙන් එහිම සඳහන් වේ. මහනායක අනුනායක ධානාන්තරවලට තෝරාගත යුත්තේ අස්ගිරි විහාරයේම ගුරු පරපුරට සම්බන්ධ සහ එහිම නේවාසිකත්වය ඇති අයවලුන්ම බව 125 වගන්තියේ සඳහන් ය. දැන උගත්කම මෙන්ම දක්ෂකම ද තිබිය යුතු බව තව ද කියැවේ.

මහානායක හිමි අපවත්වීමට ආසන්න තත්ත්වයේ වැඩසිටින්නේ නම් උන්වහන්සේ භාරයේ තිබෙන රාජකීය වස්තු කිලි කුණුවලින් බේරාගැනීම සඳහා ගතයුතු පියවර සහ උන්වහන්සේගෙ අතින්ම පීව පාංසකුලය පූජා කළයුත්තේය යන්න 148-149 වගන්තිවලින් විසතර වෙයි.

අස්ගිරි මහාවිහාරයේ එවකට පැවති සංඝාධිකරණවල ස්වරූපය 158-163 වගන්ති පාඨවලින් විස්තරවීම තුළ අධිකරණ කටයුතු හා සම්බන්ධ තනතුරු කීපයක් ද දැනගත හැකි ය. තව ද මෙහි තනතුරු නාම කීපයක් සඳහන් ය. ඒවා මෙසේ ය. **අනුවිජ්ජක, භාණ්ඩාගාරික, භත්තුදේස** යන නාමයන් ය.

මෙහි වගන්ති අංක 183 සිට අංක 186 දක්වා ඇති කරුණු අනුව විනිවිද බවින් යුතු අයවැය පාලන ක්‍රමයක් යෝජනාකැර ඇත්තේ මිහින්තලේ පුවරුලිපියේ ඇති තොරතුරු පූර්වාදර්ශය ලබාගෙන දැයි අනුමාන කළහැකි වෙයි.



අදාළ කතිකාවතේ සඳහන් වගන්ති කීපයක් තව ද නිදසුන් වශයෙන් උපුටා මෙහි අන්තර්ගත කරනු ලැබේ (43 - 57).

43. ආරාම පන්සල් ආදියෙහි වාසය නොකොට ගිහි ගෙවල් හෝ පැල් අම්බලන් ලාමක තැන්වල දින කීපයක් අරුණ ගෙවූ භික්ෂු නමක් පොහොය කිරීමට නොගෙන ඒ ඒ ආරාම වැසි තැන් වලින් සහ ඔහුන්ගෙන් විනිශ්චය කොට අන්තිම වැරදි පරාජික නොවීනම් බලවත් අඩුවම් කොට හික්මවීම යුතු මැනවි

44. මාගම් පලිරෝද යෙදී ඇති අය ශුද්ධ ඇතුව අහ බලා කාඞ්ශා නැතිනම් මිස කාඞ්ශා ඇති අය පොහොය කරන්ඩ නොගෙන අත්හැර පසුව විනිශ්චය කොට පරාජික නොවී නම් සමාගමට ගත යුතු මැනවි

45. අන්තරාවක් නැතුව ඇතුළුගම්වල මඩුවක එක් රැයක්වත් නොවිසිය යුතුයමැනවි

46. ධම් ගෞරවයෙන් කෙරුනු ධම් ශාලා මණ්ඩපාදියෙහි මිස පැල් අම්බලම් ගොනවු ආදී හීන ලාමක ස්ථානවල රාත්‍රී බණ නොකිය යුතු මැනවි

47. නැකැත් වෙදකම් අංගම් පිල්ලි හූනියම් යක්ෂ මන්ත්‍ර ජපකිරීමාදි භික්ෂූන්ට අයෝග්‍ය ශාස්ත්‍ර ඉගෙන පැවිදි ශිෂ්‍ය දරුවන්ඩ එය නුගන්වනවා සහ එයින්ලද ප්‍රත්‍ය නොවැළඳිය යුතු මැනවි

48. වෙළුදාන එල දනාදී කුල දූෂණය කොට එක්විසි අන්වේෂනයෙන් උපදවන ප්‍රත්‍ය ද නොවැළඳිය යුතු මැනවි

***49. පැවිදිතැන් විසින් ධාතු පෙති පිළිම පොත් සිවුරු පිලි ආදිය ගෙන සමාදන් වස්තු උපදවා නොවැළඳිය යුතු මැනවි***

***50. දායකවරුන්ඩ වස්ත්‍රාභරණදිය දී ඔවුන් සිතිගැණීමෙන් ද කේලම් කියා ඔහු ඔහුන් කෙරෙහි බිඳුවාලීමෙන් ද තමන් වසඟ කොටගෙන වෙන සාන පන්සල් වලට සැදි තිබෙන ගොදුරු ගම්වල අමුතු අමුතු පන්සල් නොකරවිය යුතු මැනවි***

***51. අනුන්ගේ ගම්බිම් නැති කරන්ඩ මරු යොදා නැකැත් නොකළ යුතු මැනවි***

***52. පැවිදි තැන් විසින් පන්සල්වල හරක් ගාල් බැඳ ගෙන මෙව්වල් කිරීම සහ කිරි දෙවීම නොකළ යුතු මැනවි***

***53. පැවිදි තැන් පොත් පත් සිවුරු පිලී ආදී දේ ඉදිරි ශාසනයට උපකාර වන ලෙස එම ආරාමවලම ලබනවා සහ උවදුරක් නොමැති නෑ නොකෑ කෙනෙකුන්ගේ ගෙවල්වල අරප්‍රවේශමට තබා ඔවුනුත් ඒ ප්‍රත්‍යයන් නොනැසිය යුතු මැනවි***

***54. අන්තිම වස්තු ගතියට පත්වෙන්ඩ ඉඩ ඇති බැවින් අනුන් සතු මිල මුදල් බඩු බාහිරාදිය අර ප්‍රවේශම් කර දීමට බාර නොගත යුතු මැනවි***

***55. වෙන ස්ථානවලට වෙන්වී තිබෙන ගොදුරු ගම්වල වස්වාසික මතකදාන ගෝදාන අගසස් දාන පෝයදාන පිං කුඹුරු ආදී සෑම පූජාව එම ස්ථානේ සංඝයා හැරදමා අමුතු නමක් නොගත යුතු***

***56. දෙමව්පියන්ඩ උපකාර කිරීම අනුදත් බැවින් පතා සිටිත් නම් තමා නිසි ලද කැප ප්‍රත්‍යයෙන් සංග්‍රහ කළයුතු මැනවි***




***57. සෙසු නෑයන්ඩ ඖෂධයෙන් පමණක් සංග්‍රහ කරණවා විනා ගම් බිම් තඹ පිත්තල ආදි කැප ඇකැප දේත් නෑ නොනෑයන් දහම් වරදවා සංග්‍රහ කිරීමෙන් ශ්‍රද්ධා දෙය්‍ය විනිපතනය නොකොට යුතුමැනවි***

පරමධර්ම කතිකාවතෙහි එන ශාසනික නීතිරීති සහ ආරාම කළමනාකරණය සඳහා යෝජනාකර ඇති වගන්ති මහාවිහාරයක හෝ එක පාර්ශ්වයක හෝ පරිපාලනමය අවැසියාවක් වෙනුවෙන් සම්පාදනය වන්නට ඇතැයි විශ්වාස කළහැකි වන්නේ ය. මෙම කතිකාවත පිළිබඳව මෙසේ ද සඳහන් වෙයි. .... ***එවකට පුරප්පාඩුවව පැවති මහානායක පදවියට යටවත්තේ ශ්‍රී සුවණ්ණජෝති මාහිමයන් වහන්සේ පත් කළහ. උන්වහන්සේ රජයේ සම්බන්ධයක් නොමැතිව මහා සංඝයා වහන්සේගේ කැමැත්තෙන් පත් වූ ප්‍රථම මහානායක මාහිමියන් වහන්සේ වශයෙන් සැලකේ. මෙකල සංඝයාගේ විනයානුකූල පැවැත්ම හා විහාර සතු දේපල පරිහරණය මැනවින් පවත්වා ගැනීම සඳහා අස්ගිරි මහාවිහාර මහාසංඝයා වහන්සේ විසින් පරමධර්ම කතිකාවත නමින් කතිකාවතක් සම්මත කොට ක්‍රියාත්මක කළහ.***[23] අතිගරු පලිපාන ධර්මකීර්ති ශ්‍රී ගුණරතන චන්දානන්දාභිධාන ස්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි පාර්ශවයේ මහානායක මාහිමියන් වහන්සේට අක්ත පත්‍රය ප්‍රදානය කිරීමේ රාජ්‍ය උත්සවය නිමිත්තෙන් සංස්කෘතික කටයුතු දෙපාර්තමෙන්තු විසින් නිකුත් කරන ලද අස්ගිරි මහා විහාර ඉතිහාසය යන කෘතියෙහි පරමධර්ම කතිකාත ගැන සඳහන් වන විස්තර හා ඉහත දක්වන ලද පරමධර්ම කතිකාවතේ පූර්විකාවේ එන තොතුරු හා ගැලපෙයි.

## නිගමනය

මෙම කතිකාවතේ ඡායා පිටපත් සහ යතුරු ලියනය කළ පිටත් සිය පර්යේෂණ කටයුතු සඳහා භාවිත කළ අය අතර ස්වාමීන්ද්‍රයන් වහන්සේ තුන්නමක් ප්‍රධාන වෙති. (මහාචාර්ය කුඹුරුගමුවේ වජිර හිමි මහාචාර්ය වරකාවේ ධම්මාලෝක හිමි

සහ මහාචාර්ය තුඹුල්ලේ ශ්‍රී සීලක්ඛන්ධ හිමි). අස්ගිරි මහාවිහාරයේ ඉතිහාසය සම්බන්ධයෙන් සහ ශ්‍රී දළදා මන්දිරයේ තේවාව සම්බන්ධයෙන් අදාළ තොරතුරු පැහැදිලි කිරීම සඳහා එකී මූලාශ්‍රය පූර්වෝක්ත ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් භාවිත කරන ලද ද පුස්කොළ පොතේ මුල් පිටපත පිළිබඳ ඒවායේ සඳහන් නොවෙයි. අවුරුදු 159ක් පමණ පැරණි පිටපත අස්ගිරි මහාවිහාරයේ මැදපන්සලේ තිබෙන බව ඉහත සඳහන් විය. අස්ගිරි මහාවිහාරයේ ඉතිහාසය හා සම්බන්ධ වැදගත්ම පුස්කොළ පොත් ලෙස ගැනෙන අස්ගිරි තල්පත හා අස්ගිරි උත්පත්ති කථාප්‍රකරණය වාර්තා වූයේ ද මෙම පන්සලෙන් ය. විමුක්ති මග්ග පුස්කොළ පිටපත සහ මන්දාරම්පුර පුවත පුස්කොළ පිටපත ලැබී ඇත්තේ ද අස්ගිරියේ මැදපන්සලෙන් ය. මේ දක්වන ලද පොත් සතර අනුලේඛනය කරන ලදුව මුද්‍රණයෙන් පළව තිබෙයි. අස්ගිරි මහාවිහාරයේ ඓතිහාසිකත්වය ගෙනහැර පෑම සඳහා එම පොත් වැදගත් වෙයි. පරමධර්ම කතිකාවතේ අන්තර්ගත ඓතිහාසික තොරතුරු සමකාලීන ඇතැම් තත්ත්ව සම්බන්ධයෙන් වැදගත් තොරතුරු වන්නේ ය. මෙහි ඇති විනය නීති වඩාත් පැහැදිලි කිරීම සඳහා පෙළ ද උපුටාගෙන ඇත. ඉහත දක්වන ලද 43 - 57 වගන්ති අනුව එකල භික්ෂු සමාජයේ යම් පරිහානි තත්ත්වයක් සිදුවෙමින් පැවතියේ දැයි සැක කළ හැකි ය. ලංකාවේ විහාර කතිකාවත් සහ ශාසන කතිකාවත් බොහොමයක් මුද්‍රණයෙන් පළ විය. සමාජ ඓතිහාසික වැදගත්කමක් පරමධර්ම කතිකාවතට ඇතැයි නිගමනය කරන අතර එය ද මුද්‍රණයෙන් පළ කිරිම කාලෝචිත යැයි යෝජනා කරමු.





## ආන්තික සටහන්


1. මහාවග්ග පාලි 2. බුද්ධජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථමාලා පුනර්මුද්‍රණ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල 2005. පි. 700
2. එම.
3. එම . පි . 748.
4. එම . පි . 382.
5. එම . පි . 16.
6. එම . පි . 17.
7. එම . පි . 18 - 19
8. එම . පි . 83
9. සූරවීර. ඒ. වී., සිංහල කතිකාවත් හා භික්ෂු සමාජය, ගුණසේන, කොළඹ, 1985. දෙවැනි මුද්‍රණය. පි. 4
10. එම . පි . 137
11. එම . පි . 146
12. එම . පි . 147
13. එම . පි . 145
14. එම . පි . 146
15. එම.
16. එම . පි . 155
17. කතිකාවත් සඟරා වාදය, 1922, (?) ප්‍රකාශක හා ස්ථානය හඳුනාගත නොහැක.
18. සීලක්ඛන්ධ හිමි, තුඹුල්ලේ.- අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය, විකාශනය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1997. පි. 30-38
19. එම . පි . 34
20. එම . පි . 35
21. වජිර හිමි, කුඹුරුගමුවේ, දළදා ඉතිහාසය සහ සංස්කෘත, (2008), එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, දෙවන මුද්‍රණය, පි. 487 - 490
22. PROCEEDINGS OF THE 3rd INTERNATIONAL CONPERENCE, December 8,9, and 10, 2008, Buddhasravaka Bhiksu University, Anuradhapura, Sri Lanka, p. 81 - 82
23. අස්ගිරි මහාවිහාර ඉතිහාසය, වරකාවේ ධම්මාලෝක හිමි, සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව, කොළඹ, 1976, පි.15.